# මීගමුව නගරය ආශ්‍රිත 1800-1930 කාලපරිච්ඡේදයට අයත් සොහොන් ස්මාරක අධ්‍යයනය

**යසස්මි සෙව්වන්දි සමරකෝන්**

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

---

පරිපාලන බෙදීම්වලට අනුව මීගමුව, බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයට අයත්ව ද භූගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ මීගමු කලපුව කේන්ද්‍රකර ගනිමින් වෙරළබඩ කලාපයට අයත් වේ. බටහිර යටත්විජිත සමයන්ට අයත් නොයෙකුත් පුරාස්මාරක හා සංස්කෘතික මෙම නගරයේ තවමත් ශේෂව පවතියි. මීගමුව ආශ්‍රිතව රාජකාරි කළ හා ජීවත්වූ විදේශීකයෝ මරණයෙන් අනතුරුව ස්වාගමානුකූලව මිහිදන් කිරීම් මෙම නගරය තුළම සිදුකර ඇත. එම සොහොන්වල ආභාසය සමකාලීනව දේශීයන් ද ලබාගෙන තිබේ. මෙම චාරිත්‍රවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ වූ සොහොන් ගල් ආශ්‍රයෙන් 1800 - 1930 අතර වූ සමාජීය වාතාවරණය, චාරිත්‍ර, විශ්වාස, ආභාසයන්, විවිධත්වයන්, සම්බන්ධතා සහ සොහොන් ගල් ආශ්‍රිත නිර්මාණ අගය අධ්‍යයනය අරමුණ වේ.

1800-1930 අතර කාලයට අයත් සුසාන ගල් මීගමු නගරය ආශ්‍රිතව පිටිපන සුසාන භූමියෙන් හා මීගමුව නගර සභා භූමියෙන් හමුවේ. පිටිපන සුසාන භූමිය, පිටිපන දේවස්ථානය අසලින් ඉදිරියට මීටර් 2ක් පමණ ගමන් කළ විට හමුවේ. මීගමුව පොදු සුසාන භූමිය මීගමු නගරයේ සිට ඇඩිනවස් මාර්ගයේ පිහිටා තිබේ. මේ සම්බන්ධව පූර්ව පර්යේෂණ සංක්ෂිප්තව සිදු කෙරී ඇත. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා සිදු කරන ලදී. පර්යේෂණ අරමුණු හා ස්වරූපය මත ලිඛිත මූලාශ්‍රය අධ්‍යයනය සිදුකරනු ලැබිණි. මෙමගින් උක්ත කාල පරාසයට අයත් සොහොන් ගල් වාර්තාකරණය සිදුකළ අතර සොහොන් කොත් අධ්‍යයනය මගින් විදේශියන් අනුගමනය කළ සොහොන් ස්මාරක පිහිටුවීමේ ක්‍රම දේශීය ජනප්‍රධානීන් හා උසස් සමාජීය කොටස් දිගින් දිගටම පවත්වා ගෙන ගොස් ඇති බව ද දේශීය සාමාන්‍ය කතෝලික ජනතාව සොහොන් කොත් නිර්මාණය ඉතා සරල හා සිංහල භාෂාව ප්‍රධාන මාධ්‍ය කොටගෙන සිදුකර ඇති බව ද හඳුනාගැනිණි. මුල්කාලීනව කළුගල් භාවිතා කළ ද පසුකාලීනව දේශීය හෝ විදේශීය උසස් සමාජය ආනයනික කිරිගරුඬ ස්මාරකවලට යොමු වී ඇතත් දේශීය සාමාන්‍ය කතෝලිකයන් අතර කිරිගරුඬ ගල් භාවිතයක් දක්නට නොමැත. ආගමික නැඹුරුව හොඳින් දක්නට ලැබෙන අතර විදේශිය ආභාසය කල්ගත වන තෙක් දේශීය සමාජවල තදින් පැවති බව පෙනී යයි. අක්ෂර භාවිතය හා නාමකරණය ද මෙයට සාක්ෂි වේ. දේශීය බෞද්ධ ජනතාව ද මෙම ක්‍රමය තම සොහොන් ස්මාරකය සැකසීමේ දී ආභාසයට ගෙන ඇත. 1800-1930 දක්වා සමාජ ස්තරායන සම්බන්ධ වැදගත් සාධක කිහිපයක් ද මේ හරහා හඳුනාගැනිණි.

ප්‍රමුඛ පද : සොහොන් ගල්, බයිබල් පාඨ, මරණය, ශෝකය